# 2 සීගිරිය

'සීගිරිය' අප සතු විශිෂ්ට වූත් ඓතිහාසික වූත් නිර්මාණයකි. සීගිරි බිතු සිතුවම් හා කැටපත් පවුරේ අඩංගු කුරුටු ගී සීගිරිය සතු විශිෂ්ට දායාද වේ. ලෝක උරුමයක් ලෙස 'සීගිරිය' අන්තර්ජාතික ගෞරවයට පාත්‍ර වූ ස්ථානයකි.



සීගිරිය අපේ ඉතිහාසයට එක් වන්නේ ක්‍රිස්තු වර්ෂ පස්වෙනි සියවස පමණ කාලයේ සිට ය. එනම් ක්‍රි. ව. 477  495 කාලය තුළ සීගිරිය සිය රාජධානිය කර ගත් පළමුවන කාශ්‍යප රාජ්‍ය සමයේ සිට ය. කඳුහෙල්වලින් හා වනපෙත්වලින් ද, මිනිසා විසින් තනන ලද මහ වැව්වලින් ද, පැරණි ගම්මානවලින් ද  සමන්විත සීගිරිය උද්‍යාන නගරයකි. පළමුවන කාශ්‍යප රජතුමා සීගිරිය සිය රාජධානිය කර ගෙන එය මනා සේ සැලසුම් කළ රම්‍ය නගරයක් බවට පත් කළේ ය.

සීගිරිය ආසියාවේ ඇති ප්‍රධාන පුරා විද්‍යාත්මක මධ්‍යස්ථානවලින් එකකි. මීටර් 200ක් පමණ උසින් පිහිටි සීගිරි පව්ව මුදුනේ රජ මාලිගය පිහිටා තිබූ අතර, පර්වතය පාමුල පවුරු පදනම් ද ගල් කුළු, පොකුණු හා දිය අගලින් විසිතුරු වුණු උද්‍යාන ද විය. සීගිරිය ආශ්‍රිතව දශක ගණනාවක් පුරා පර්යේෂණ කළ මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් සීගිරිය පිළිබඳ පළ කළ මතය වූයේ "සීගිරිය බලකොටුවක් නොව ආලකමන්දවක්" බවයි.

සීගිරිය සංචාරකයන්ගේ සිත් ඇද ගන්නේ ප්‍රධාන කරුණු දෙකක් හේතුවෙනි. ඒ සීගිරි කැටපත් පවුරේ ඇති  කුරුටු ගී රාශිය හා සීගිරියේ ඇති ලෝක ප්‍රසිද්ධ සිතුවම් පෙළයි. සීගිරිය ලෝ පතළ වී ඇත්තේ මේ බිතු සිතුවම් පෙළ නිසා ය. අව්වැසිවලින් වන උවදුරුවලට ලක් නොවී මේ බිතු සිතුවම් එක් වකවානුවක සීගිරි පර්වතයේ බටහිර පැත්ත පුරාම විහිදී තිබුණි. එහෙත් අද ඉන් ඉතිරි වී ඇත්තේ සිතුවම් කිහිපයක් පමණි. මේ බිතු සිතුවම්වල දැක්වෙන අප්සරාවන් පිළිබඳ ව විවිධ මත ප්‍රකාශ වී ඇත. ලංකාවේ දැනට ඉතිරි වී ඇති චිත්‍රවලින් සීගිරි බිතු සිතුවම් පැරණි ම ඒවා ය.

සීගිරි බිතු සිතුවම් හැරුණු විට සීගිරි කැටපත් පවුරේ ඇති කුරුටු ගී නිසා ද සීගිරිය විශේෂත්වයක් උසුලයි. සීගිරිය නැරඹීමට පැමිණි විවිධ අය විසින් ලියන ලද කවිවලින් සීගිරි කැටපත් පවුර සමන්විත වේ. මේ කුරුටු ගී ලියා ඇත්තේ ක්‍රි. ව. හත්වන සියවසේ සිට දහතුන්වන සියවස දක්වා කාල පරිච්ඡේදය තුළ දී ය.

## ක්‍රියාකාරකම්

1. පාඩම ශබ්ද නගා කියවන්න.

2. පාඩම කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. සීගිරිය අයත් වන්නේ ලංකාවේ කුමන පළාතට ද?

   ii. සීගිරිය ඉදි කළේ කවුරුන් විසින් ද?

3. එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පදයට සමාන තේරුම දෙන පදය පාඩමින් තෝරා ලියන්න.

   i. සීගිරිය **පෞරාණික** නගරයකි.

   ii. මංජු ශ්‍රී මහතා විශිෂ්ට **චිත්‍ර** ශිල්පියෙකි.

   iii. **බස්නාහිර** අහස වැහි වලාකුළෙන් බර විය.

   iv. සිංහරාජ **වනාන්තරය** ලෝක උරුමයකි.

   v. පේරාදෙණිය මල් **උයන** කාගේත් සිත් ගත් සුන්දර ස්ථානයකි.

4. ‘සීගිරිය’ පිළිබඳ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

5. ලෝකයේ මෙවැනි වෙනත් විශිෂ්ට නිර්මාණ පිළිබඳ ව කරුණු එකතු කරන්න.

6. කොටුවල ඇති අකුරු සහිත වචන පාඩමෙන් සොයා ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| ශ | ධ | ෂ | ඡ | ණ |

### භාෂා භාවිතය

1. පහත සඳහන් වාක්‍යවල ක්‍රියාපදය ලියන බසට ගැළපෙන සේ නිවැරදි කොට ලියන්න.

   i. රජතුමා ශාලාවට පැමිණියා ය.

   ii. මම උදයෙන් ම නැගිට පාසල් යන්නට පිටත් වීය.

   iii. අපි තෙල් මල් පහන් රැගෙන පන්සල් ගියා ය.

   iv. වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කළා ය.

   v. මිනිස්සු මහන්සි වී වැඩ කරයි.

2. මේ පදවලට විශේෂණ පද එකතු කරන්න.

i. ලෝකය

ii. වැව

iii. පවුර

iv. රාජධානිය

v. අහස

3. පහත සඳහන් ඒකවචන පද බහුවචනයට හරවා ඔබේ පොතේ ලියන්න.

i. නගරය

ii. චිත්‍රය

iii. අගල

iv. මතය

v. ගම්මානය

4. එම බහුවචන නාම පද යොදා වාක්‍ය සකස් කර ඔබේ පොතේ ලියන්න.

5. වරහන් තුළ ඇති පද අතරින් සර්ව නාම පද යොදා මේ වාක්‍යවල හිස්තැන් පුරවන්න.

i. ...................................... ගෙදර යයි. (ශිෂ්‍යයා/ඔහු)

ii. ..................................... ජලයේ ජීවත් වන සතෙකි. (තල්මසා/ඌ)

iii. ...................................... පාඩම් කරමු. (ළමයි/අපි)

iv. ..................................... පාඩම් කියවූවෙහි. (සුනිල්/ඔබ)

v. ...................................... කවි ගායනා කළා ය. (ඈ/නංගී)